**ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය - 2018**

-----------------------------------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 **විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කළ යුතු වුවද, පිරිවැය රු.204,839,496 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනයකින් තොරව ආයතනයේ භාවිතයට ගෙන තිබුණද එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගයන් ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරමින් පවතී. | ගිණුම් කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ----------- |
| (අ) “බනානා ව්‍යාපෘතිය” වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු.10,250,125 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | 2019 වර්ෂයේදී ගැලපීම් නිවරදි කර ඇත. | ලැබිය යුතු මුදල නිවරදිව ගිණුම් ගත කල යුතුයි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශයෙන් ලබාදෙන ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල වැඩසටහන් තුනක් වෙනුවෙන් ඇස්තමේන්තු ගත පිරිවැයට වඩා වැඩිපුර දරන රු.460,008 ක් වර්ෂයේ වියදමක් ලෙස නොසලකා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදලක් ලෙස විවිධ ණයගැතියන් යටතේ දක්වා තිබුණි. | | |
| (ඇ) විවිධ ණයගැතියන් තුල භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇති රු.5,442,000 ක් තුල CCTV කැමරා පද්ධතියක් සවිකිරීම සඳහා ඉල්ලුම් කරන ලද රු.3,108,500 ක් ඇතුලත් වී ඇති අතර , එම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ලැබිය යුතු ගිණුම් ශේෂය රු.3,108,500 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. | C.C.T.V කැමරා පද්ධතියක් මිලදී ගැනීමට නොහැකි විය. | වර්ෂයේදී දරන ලද වියදම් සඳහා පමණක් මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලීම කළ යුතුයි. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | ------------ |
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳ ණයගැති ශේෂය වූ රු.6,780,996 කින් රු.4,127,737 ක් වසර 03 ඉක්ම වූ ණයගැති ශේෂයන් විය. | වසර 03 ඉක්ම වූ ණය ගැතියන් කපා හැරීමට අමාත්‍යාංශය වෙත දන්වා ඇත. | ණය ගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් ආයතනය තුල ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සියලුම දීමනා සඳහා අදාල අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ හා අනෙකුත් අදාල ආයතනවලින් අනුමැතිය ලබා ගත යුතු වුවද කළමනාකරණය විසින් සති අන්ත පුහුණු පාසැල් දීමනා , පාඨමාලා සම්බන්ධීකරණ දීමනා, ව්‍යාපෘති සම්බන්ධීකරණ දීමනා, පාලන ලේකම්ගේ දීමනා හා ගණකාධිකාරී දීමනා ලෙස 2018 වර්ෂයේ රු.2,961,879 ක් ගෙවා තිබුණි. | පාලක මණ්ඩල අනුමැතිය මත ගෙවීම් සිදු කරන ලද අතර භාණ්ඩාගාරය වෙත දැනුම් දී ඇත. | ලේකම්ගේ අනුමැතිය මත මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.24,658,844 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.54,535,545 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,876,701 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ පුහුණු කිරීම් ආදායම රු.29,443,545 කින් අඩු වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කළමනාකරණය විසින් රු.214,925,758 ක් වූ අතිරික්ත අරමුදල් කෙටි කාලීන තැන්පත්වල ආයෝජනය කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.17,980,982 ක පොලී ආදායමක් ලැබී තිබුණි. නමුත් ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකරගැනීමෙහිලා ඵලදායී ලෙස එම අරමුදල් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය වේ. | අතිරික්ත අරමුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර ඇත. | ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකරගැනීමෙහිලා ඵලදායී ලෙස අරමුදල් යොදාගත යුතුයි. |

| | | |
|---|---|---|
| (ආ) පේෂ කර්ම හා ඇඟළුම් ක්ෂේත්‍රයට අදාල පාඨමාලා සහ පශ්චාත් උපාධි සහ උපාධි පාඨමාලා පැවැත්වීමට අවශ්‍ය මූලික පහසුකම් සපයා ගැනීමේ අරමුණින් මහල් 4 ක නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2015 නොවැම්බර් 11 දින කැබිනට් අනුමැතිය ලැබී තිබුණු අතර නැවත ගොඩනැගිලි සැලසුම වෙනස් කර මහල් 6 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට 2017 දෙසැම්බර් 19 දින කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව නව ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තු මුදල රු.505,910,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේදී රුපියල් මිලියන 18ක් හා 2017 වර්ෂයේ රුපියල් මිලියන 5 ක් වශයෙන් රුපියල් මිලියන 23 ක් භාණ්ඩාගාරය ලබා දී තිබුණි. එයින් රු.මිලියන 3.6 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැයකර තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු 2019 මැයි 31 වන විටත් අවසන් කර නොතිබුණ අතර ඉදිකිරීම් කටයුතුද ආරම්භ කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබේ. | භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුයි. |

### 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවලදී රේඛීය අමාත්‍යාංශයෙන් ලබාදී තිබුණු ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය ආරම්භයට Wet processing වැඩසටහන, ශිෂ්‍යත්ව අරමුදල, මරදමුනේ නූල් වර්ණ ගැන්වීමේ පුහුණු මධ්‍යස්ථානය ගොඩනැංවීම, සෞඛ්‍ය ආරක්ෂන වැඩසටහන හා මහන මැෂින් අළුත්වැඩියා පුහුණු වැඩසටහන සඳහා ලබාදී තිබූ වටිනාකම පිළිවලින් රු.420,537 ක් රු.236,867 ක්, රු.2,243,450 ක්, රු.1,406,663 ක් හා රු.1,047,344 ක් වර්ෂය තුල කිසිදු කාර්යයක් සඳහා උපයෝගී කරගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී ගණුදෙනු කිසිවක් සිදුවී නොතිබුණි. | භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුයි. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | ------------ |
| (අ) | භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.6,000,000 ක් වූ අතර ඒ වෙනුවෙන් 2017 දෙසැම්බර් මාසයේදී රු.6,411,515 ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. දෙපාර්ශවය අතර එළඹී ගිවිසුම ප්‍රකාරව 2018 සැප්තැම්බර් 09 දින සිට දින 60 ක් ඇතුලත මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කල යුතු වුවද, මෙතෙක් අදාල කොන්ත්‍රාත්තුව නිම කර නොතිබුණි. උපදේශන සේවා සැපයීම හා අත්තිකාරම් මුදල වශයෙන් රු.2,101,562 ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුයි. |
| (ආ) | සම්මන්ත්‍රණ ශාලාව නවීකරණය කිරීම වෙනුවෙන් රු. 10,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණ අතර ඒ වෙනුවෙන් 2018 ඔක්තෝබර් 30 දින රු.9,695,000 ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් ලෙස සිදු නොවීම හේතුවෙන් එම මුදල සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිවී තිබුණි. | 2019 අප්‍රේල් මාසයේදී නවීකරණ කටයුතු ආරම්භ කරන ලදි. | භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුයි. |
| (ඇ) | 2018 වර්ෂයේදී රෙදිපිළි පුස්තකාලයක් සකස් කිරීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් රු. 3,260,000 ක් අනුමත කර තිබුණි. මෙම පුස්තකාලය වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. 392,302 ක ලී බඩු හා උපකරණ මිලදී ගෙන තිබුණි. නමුත් රෙදිපිළි පුස්තකාලයෙහි ඉදිකිරීම් ආරම්භ කර නොතිබීම නිසා මිලදී ගන්නා ලද උපකරණ ප්‍රයෝජනයට නොගෙන ආයතනයේ පෙහෙකම්හල් ගොඩනැගිල්ලෙහි (Weaving Workshop) නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | ගොඩනැගිලි සෑදීමට අවශ්‍ය ඉඩ පිළිබඳ ගැටළුව නිසා එය සිදු කිරීමට නොහැකි විය. ඉදිරියේදී රෙදිපිළි පුස්තකාලය සෑදීමට කටයුතු කෙරේ. | අනුමතකර ඇති පරිදි රෙදිපිළි පුස්තකාලය ආරම්භ කල යුතුයි. |
| (ඈ) | මහල් 4 ක නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පැරණි ගොඩනැගිල්ලේ කොටසක් කඩා ඉවත් කිරීමට සිදුවන බැවින් එම කාර්යාල කටයුතු සිදු කිරීම වෙනුවෙන් කුලී පදනම මත මාසික වාරිකය රු. 80,000 ක් | යෝජිත ගොඩනැගිල්ල ඉතා ඉක්මනින් ඉදිකිරීමට නියමිතව තිබූ බැවින් කුලී පදනම මත | ගොඩනැගිල්ල භාවිතයට නොගෙන වසා දමා තිබීම අනාර්ථික ගණුදෙනුවක් වේ. |

| | | | |
|---|---|---|---|
| | වූ ගොඩනැගිල්ලක් 2017 ජූනි 01 සිට වර්ෂයක කාලයක් සඳහා ලබා ගෙන තිබුණි. නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ නොකිරීම හේතුවෙන් කුලී පදනම මත ලබාගන්නා ලද ගොඩනැගිල්ල භාවිතයට නොගෙන වසා දමා තිබූ අතර දින කිහිපයකට පමණක් එහි පුහුණු ශිෂ්‍යයින් කිහිපදෙනෙකුට නවාතැන් ලබා දී තිබුණි. එම කුලී ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය 2018 අප්‍රේල් 16 දින සිට අවලංගු කර තිබුණද මේ සඳහා රු. 960,000ක් ගොඩනැගිලි කුලී වශයෙන්ද ජල විදුලිය වෙනුවෙන් රු.8,353ක්ද ගෙවා තිබුණි. | ගොඩනැගිල්ලක් ලබා ගන්නා ලදි. | |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) අනුව කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත්කල යුතු අතර 5.4.8 (ආ) විධිවිධාන පරිදි කාර්යසාධන සුරක්ෂණය වැඩ නිමකිරීමට අපේක්ෂිත දිනය පසුව දින 28ක් දක්වා වලංගුවිය යුතුය. ආයතනයේ භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම සඳහා 2017 ඔක්තෝබර් 14 දින ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය යටතේ ලංසු කැඳවීම් සිදුකර තිබූ අතර 2017 නොවැම්බර් 28 දින රු.8,024,885 ක පිරිවැයකට ලංසුව ප්‍රදානය කර තිබුණි. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්තුව සඳහා ලබාගෙන තිබූ රු.802,488 ක් වූ කාර්ය සාධන සුරක්ෂණයේ වලංගු කාලසීමාව 2018 මාර්තු 07 දිනට අවසන් වී තිබුණි. 2018 ජූලි 23 සිට දෙසැම්බර් 31 දින දක්වා පමණක් නැවත කාර්යසාධන සුරක්ෂණයේ කාලය දීර්ඝ කර තිබුණි. අත්තිකාරම් සඳහා ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයේද කාලය අවසන් වී අවුරුදු 01 මාස 03 ක් ඉක්මවා තිබුනද එය අළුත් කිරීමට කටයුතු කර නොතිබුන අතර කොන්ත්‍රාත්තුවේ නිම කරන ලද වැඩ පිළිබඳ ඉංජිනේරුවරයාගේ වාර්තාවක් ලබා දී නොතිබුණි. | කාර්යසාධන සුරක්ෂණයේ කාලය දීර්ඝ කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම අවසන් කල යුතුයි. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 140 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 93 ක් වූයෙන් පුරප්පාඩු 47ක් පැවතුණි. පෙර වර්ෂය සමඟ සැසඳීමේදී මෙම පුරප්පාඩු සංඛ්‍යාව 05 කින් ඉහල ගොස් තිබුණු අතර මෙම තනතුරු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ආයතනයේ පිරිවැය සලකා බලා බඳවා ගැනීම සිදු කෙරේ. | පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගත යුතුයි |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂය ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණු පාඨමාලා 208 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණු ද මාසික පුහුණු වැඩසටහන් සැලැස්මට අනුව ක්‍රියාත්මක කර තිබුණේ පාඨමාලා 47 ක් පමණි. | ඇතැම් පාඨමාලා සඳහා ළමයින් ඉල්ලුම් කර නොමැතිවීම පාඨමාලා නොපැවැත්වීමට හේතු විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා පැවැත්විය යුතුයි. |